SRI LANKA EXPORT DEVELOPMENT BOARD
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

පුරප්පාඩු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), අපනයන ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු ප්‍රමුඛතම වෙළඳ රාජ්‍ය ආයතනය වන අතර රජයේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. රටට වැඩි විදේශ විනිමය ඉපැයීමට හැකි වන සේ පුද්ගලික අංශයට ඔවුන්ගේ අපනයන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීම සහ මඟපෙන්වීම සඳහා උපාය මාර්ග හා වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ අපනයනයේ එවැනි වර්ධනයක් අත්කර ගැනීම සඳහා, අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්ව කණ්ඩායමට සහ සහායක කාර්ය මණ්ඩලයට එක් වන ලෙස විශිෂ්ට නායකත්ව කුසලතා සහිත ස්වයං අභිප්‍රේරිත වෘත්තිකයන්ට ආරාධනා කරනු ලැබේ.

(01) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පාලන තනතුර (HM 2-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

ආයතනයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි විසින් පවරන ලද පරිපාලන සහ මූල්‍යමය කටයුතුවලට අදාළ බලතල, කාර්යයන්/රාජකාරි ක්‍රියාත්මක කිරීමේ වගකීම හා ආයතනයේ සියලුම අංශය / ඒකකවලට පරිපාලන සහ මූල්‍යමය කටයුතු සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/ වාණිජ්‍යය / කලා / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථය ආශ්‍රිත සාමාජිකත්වය සමග රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එයින් වසර පහක් (5) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
2 තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ්‍යය / කලා / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධියෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (5) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ (HM 1-1) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් / සහ / බහු-විනය කණ්ඩායම් මෙහෙයවීමට සහ නායකත්වයට සනාථ වූ හැකියාවක්. මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.

(02) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන තනතුර (HM 2-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

ආයතනයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි විසින් පවරා ඇති සංවර්ධන කටයුතු, මෙහෙයුම් සහ තාක්ෂණික කටයුතුවලට අදාළ රාජකාරි, කාර්යයන් / බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ අලෙවි සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථය ආශ්‍රිත සාමාජිකත්වය සමග රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එයින් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ (HM 1-1) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් / සහ / බහු-විනය කණ්ඩායම් මෙහෙයවීමට සහ නායකත්වයට සනාථ වූ හැකියාවක්. මානව සහ අනෙකුත් සම්පත් නිසි සංවර්ධනය සහ කාර්යක්ෂම කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.

වයස් සීමාව (1) සහ (2) තනතුරු සඳහා:

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : HM 2-1 (1) සහ (2) තනතුරු සඳහා:

රු. 161,140/- 12 X 4,850 = රු. 219,340/- :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උප ලේඛනයේ සඳහන් උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ.

2025 වර්ෂය සඳහා මාසිකව ගෙවන ලද මූලික වැටුප - රු. 119,494/=.

2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි - රු. 140,317/= (ඊට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800/= සහ තනතුරට අදාළ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා)

අනෙකුත් ප්‍රතිලාභ :

2016.10.27 දිනැති ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (PED) 1/2015(i) චක්‍රලේඛය සහ අදාළ සංශෝධන අනුව වාහනයක් ලබා දෙනු ලැබේ. (HM 2-1 සහ HM 1-1 කාණ්ඩවල තනතුරු සඳහා පමණි)

(03) අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණය තනතුර (HM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

ආයතනයට තොරතුරු තාක්ෂණ සේවා සැපයීම, වෙළඳ ද්වාරයක් පවත්වා ගෙන යාම, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, විද්‍යුත් සන්නිවේදනය, විද්‍යුත් ප්‍රවර්ධනය යනාදිය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් කිරීම සහ තීරණ ගැනීම, ආයතනයේ වත්මන් සහ අනාගත ව්‍යාපාරික ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය විසඳුම් සැපයීම. පරිගණක දෘඩාංග මෘදුකාංග, භාවිතය, ප්‍රවේශය සහ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව හිතකර තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම. තොරතුරු තාක්ෂණ සම්පත් සැලසුම් කිරීම, අයවැයකරණය, මෙහෙයුම් මුලපිරීම සහ කාර්ය සාධනය සහ ප්‍රතිඵල සහ අංශයේ සමස්ත පරිපාලනය තිරීක්ෂණය කිරීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / පරිගණක විද්‍යාව / තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "කළමනාකරණ මට්ටමේ තනතුරක" අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, කළමනාකරණ කාණ්ඩයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(04) අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන තනතුර (HM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

වෙළඳපොළ කලාප තුළ වෙළඳපළ සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම, අපනයන වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීමේ දී කාර්ය මණ්ඩලයට මග පෙන්වීම සහ මෙහෙයවීම, විකුණුම් මෙහෙයුම්, ප්‍රදර්ශන පැවැත්වීම, වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම, වෙළඳපළ තොරතුරු බෙදා හැරීම, කලාපවල වෙළඳපළ සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල සමග සම්බන්ධ වීම, කලාප තුළ ප්‍රධාන වෙළඳපොළවල ශ්‍රී ලංකා අපනයන අංශයේ භෞතික පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා පියවර තීරණය කිරීම, ඩිජිටල් අලෙවිකරණය සහ අංශයේ සමස්ත පරිපාලනය සඳහා වගකීම දැරිය යුතුයි.

(05) අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන තනතුර (HM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාකාරකම් සහ අපනයන සංවර්ධන අවස්ථා හඳුනා ගැනීමේ දී කාර්ය මණ්ඩලය මෙහෙයවීම, අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල සමස්ත පරිපාලනය සඳහා වගකිව යුතුය. පළාත් කාර්යාල ජාලය පුළුල් කිරීම, කලාපීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අනාගතයේ දී අපනයනකරුවන් බවට පත් කිරීම සඳහා ධාරිතා වර්ධනය, නිෂ්පාදන සංවර්ධනය සහ වෙළඳපොළ සංවර්ධන වැඩසටහන ඇතුළු සියලු ම ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම. කලාප තුළ අපනයන නිෂ්පාදන ගම්මාන (EPV)/ අපනයන සැකසුම් සමාගම් (EPC) ව්‍යාපෘතිවල සමස්ත අධීක්ෂණය. ප්‍රාදේශීය සංවර්ධන අංශයේ සමස්ත පරිපාලනය සහ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සංවර්ධන කටයුතු සඳහා වගකීම දැරිය යුතුය.

සුදුසුකම් (4) සහ (5) :

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍යය / විද්‍යාව / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්. සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) ලබා තිබීම හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළව සහ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබීම.
2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පූර්ණ සාමාජිකත්වය සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමින්" අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, කළමනාකරණ කාණ්ඩයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස් සීමාව (3), (4) සහ (5) තනතුරු සඳහා:

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

(06) අධ්‍යක්ෂ තනතුර - ජාතික කාබනික පාලන ඒකකය (HM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

ඒකකයේ සියලුම මෙහෙයුම් / කළමනාකරණ සහ පරිපාලනය සහ අධීක්ෂණය සඳහා ප්‍රතිපත්ති සැකසීම සහ ස්ථාපිත කිරීම සඳහා වගකිව යුතුය. ජාතික කාබනික පාලන ඒකකය සඳහා උපාය මාර්ග, ක්‍රියාකාරකම්, වාර්ෂික සැලැස්ම, ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සහ වාර්ෂික මූල්‍ය හා මෙහෙයුම් වාර්තා වරින් වර සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම. ජාතික කාබනික පාලන ඒකකයෙහි කමිටු සහ කාර්ය මණ්ඩලයට වගකීම් පැවරීම. උපදේශක කමිටු - තාක්ෂණික සහ ප්‍රමිති සහ සහතික කිරීම සකස් කිරීම/සම්බන්ධීකරණය කිරීම. කාබනික නිෂ්පාදනයේ සංවර්ධනයට සහාය වීම සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා කාබනික සහතික පිළිගැනීමට අදාළ ගිවිසුම්ගත ගිවිසුම් ඇති කිරීම. ජාතික කාබනික පාලන ඒකකයෙහි දේශීය / විදේශීය සහ කමිටු සමඟ සම්බන්ධීකරණය කිරීම. ජාත්‍යන්තර මට්ටමින් ප්‍රතිතනය ලබා ගැනීම. නීතිමය කරුණු, අභියාචනා, පැමිණිලි, ආරවුල් ආදිය පිළිබඳ තීරණ සඳහා වගකිව යුතුය. ජාතික කාබනික පාලන ඒකකයෙහි රෙගුලාසි වලට එකඟ වීම. රටේ සහතික කිරීමේ ඉල්ලීම් සපුරාලීම සඳහා පරීක්ෂණ සහ සහතික කිරීමේ ආයතන සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම. ජාතික කාබනික පාලන ඒකකයෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් සැපයීම. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ජාතික කාබනික පාලන ඒකකයෙහි සහ එහි සේවාවන් ප්‍රවර්ධනය කිරීම සහ සෑම අවස්ථාවකම ජාතික කාබනික පාලන ඒකකය නියෝජනය කිරීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය හෝ අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය, ලබා තිබීම සහ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ "කළමනාකරණ මට්ටමින්" අවම වශයෙන් අවුරුදු පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, කළමනාකරණ කාණ්ඩයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස් සීමාව (6) තනතුර සඳහා :

අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : HM 1-1 (3), (4), (5) සහ (6) තනතුරු සඳහා:

රු. 140,640/- 15 X 4,100 = රු. 202,140/-

වැටුප් ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයේ සඳහන් උපදෙස් අනුවය.

2025 වර්ෂය සඳහා මාසිකව ගෙවන ලද මූලික වැටුප - රු. 105,399/-.

2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි - රු. 123,019/- (ඊට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800/= සහ තනතුරට අදාළ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා)

අනෙකුත් ප්‍රතිලාභ :

2016.10.27 දිනැති ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (PED) 1/2015(i) චක්‍රලේඛය සහ අදාළ සංශෝධන අනුව වාහනයක් ලබා දෙනු ලැබේ. (HM 2-1 සහ HM 1-1 කාණ්ඩවල තනතුරු සඳහා පමණි)

තෝරා ගැනීමේ ක්‍රමය (1), (2), (3), (4), (5) සහ (6) තනතුරු සඳහා :

පත්කිරීමේ අධිකාරිය (EDB) විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

(07) සහකාර අධ්‍යක්ෂ තනතුර (MM 1-1)

පුරප්පාඩු ගණන (03)

රැකියා විස්තරය

වෙළඳ සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම. සැපයුම් සංවර්ධන අවස්ථා හඳුනා ගැනීම, කුඩා හා මධ්‍ය පරිමාණ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම. අපනයනකරුවන්ට බලපාන සර්ව ආර්ථික ප්‍රශ්න වලට අදාළ අධ්‍යයනයන් සිදු කිරීම සහ එම ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රතිපත්තිමය පියවර නිර්දේශ කිරීම. භාණ්ඩ නිෂ්පාදනය තත්ත්වය උසස් කිරීම සහ ඇසුරුම් සංවර්ධනය කිරීම ආදී අවශ්‍ය උපදේශක සේවා ලබා දීම. ඉහළ කළමනාකාරිත්වය විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රක උපාධියක් ලබා තිබීම සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාව / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර එකක (01) පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

(08) සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන තනතුර (MM 1-1)

පුරප්පාඩු ගණන (03)

රැකියා විස්තරය:

මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. පුහුණු/කාර්ය මණ්ඩල සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම - දේශීය සහ විදේශීය සහ මානව සම්පත් සංවර්ධනය සඳහා සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. බඳවා ගැනීම්, උසස්වීම්, වැටුප් වර්ධක ලබා දීම, සේවක අර්ථ සාධක අරමුදල (EPF), සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) සම්බන්ධ කරුණු පිළිබඳව කටයුතු කිරීම. කාර්යක්ෂමතා කඩඉම් විභාග, වැටුප් සංශෝධන ආදිය පිළිබඳව කටයුතු කිරීම. විනය කටයුතු. නිවාඩු, පැමිණීම සහ අතිකාල, වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය සහ අනෙකුත් සුභසාධන කටයුතු පිළිබඳව කටයුතු කිරීම. ආයතනයේ පරිපාලන කාර්යයන් සඳහා පහසුකම් සැලසීම. ආරක්ෂක කටයුතු (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල) අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම. කුලී/කල්බදු ගිවිසුම් අලුත් කිරීම සහ රක්ෂණ ආවරණය ඇතුළුව කාර්යාල ගොඩනැගිලි බදු මුදල් පියවීමට අදාළ කටයුතු කිරීම. දුරකථන, ජලය සහ විදුලි සැපයුම නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම. තැපැල් සහ භාණ්ඩ ප්‍රවාහනයට අදාළ කටයුතු. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සැපයුම් කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අපනයන සංවර්ධන මණ්ඩලයෙහි (EDB) ප්‍රවාහන ඒකකය අධීක්ෂණය සහ වාහන සමූහය නඩත්තු කිරීම. ඉහළ කළමනාකාරීත්වය විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී.

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය (මානව සම්පත් කළමනාකරණ පිළිබඳ විශේෂ) / කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණ පිළිබඳ විශේෂ) / වාණිජ්‍ය (B.Com) උපාධිය සහ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

(09) සහකාර අධ්‍යක්ෂ තනතුර - අධීක්ෂණ සහ ඇගයීම (MM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සැලසුම් අංශයට සහාය වීම. අංශ විසින් පවත්වනු ලබන ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම්වල ගැන්ට් ප්‍රස්ථාර විශ්ලේෂණය කර ප්‍රගති විශ්ලේෂණය අංශයන් වෙත දැනුම් දීම. ලබා දී ඇති දිනවල උපායමාර්ගික සැලැස්මේ ක්‍රියාකාරකම් සාක්ෂාත් කර නොගත් විට තිරීක්ෂණය කර නිලධාරීන් දැනුවත් කිරීම. විදේශීය වෙළඳ ප්‍රදර්ශන සහ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රගතිය තිරීක්ෂණය කර ප්‍රගතිය වාර්තා කිරීම. පුහුණු වැඩසටහන් වල කාර්යක්ෂමතාව තක්සේරු කර කළමනාකරණයට දැනුම් දීම. පුහුණු වැඩසටහන්, වෙළඳ ප්‍රදර්ශන ඒකකයේ සියලුම කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ (HRM) අධ්‍යක්ෂවරයාට සහාය වීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයක පිළිගත් ව්‍යාපෘති කළමනාකරණය/ආර්ථික විද්‍යාව/සංවර්ධන අධ්‍යයනය/අධීක්ෂණ සහ ඇගයීම/සංඛ්‍යාලේඛන සහ පර්යේෂණ/ පිළිබඳ උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

වයස් සීමාව (7), (8) සහ (09) තනතුරු සඳහා :

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : MM 1-1 (7), (8) සහ (9) තනතුරු සඳහා

රු. 91,690/- 10 X 2,480 - 15 X 3,450 = රු. 168,240/- . 2025.03.25 දිනැති අංක 01/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ.

2025 වර්ෂය සඳහා ගෙවන ලද මූලික වැටුප - රු. 71,730/-.

2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි - රු. 81,710/- (ඊට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800/- සහ තනතුරට අදාළ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා)

තෝරා ගැනීමේ ක්‍රමය (7), (8) සහ (9) තනතුරු සඳහා :

පත්කිරීමේ අධිකාරිය (EDB) විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ / හෝ ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත.

(10) අපනයන ප්‍රවර්ධන නිලධාරී තනතුර (JM 1-1)

පුරප්පාඩු ගණන (18)

රැකියා විස්තරය:

ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ අංශයේ/ඒකකයේ මෙහෙයුම් කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම. අදාළ ක්ෂේත්‍ර සඳහා දත්ත / තොරතුරු යාවත්කාලීන කිරීම. භාණ්ඩ හා සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ වෙනත් කාර්යයන්හි නිරත වීම. ඉහළ කළමනාකාරිත්වය විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍යය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2) :

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

(11) ප්‍රසම්පාදන නිලධාරී තනතුර (JM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

සංවිධානයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සඳහා සියලුම සැපයුම් සහ සේවා සැපයීම. මණ්ඩලයේ ක්‍රියා පටිපාටි සහ සැපයුම් සහ සේවා ටෙන්ඩර් කිරීම ඇතුළු අනෙකුත් අදාළ නියමයන්ට අනුකූලව, ආයතනයේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන් සහ බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම. ප්‍රසම්පාදන ඒකකය සම්බන්ධීකරණ/සංයුක්ත ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සැපයුම් කළමනාකරණය / පහසුකම් (Logistics) කළමනාකරණය / සැපයුම් දම කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2) :

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

(12) පරිගණක වැඩසටහන් සම්පාදක තනතුර (JM 1-1)

පුරප්පාඩු ගණන (01)

රැකියා විස්තරය:

සියලුම අංශ / ඒකකවලට අවශ්‍ය පරිගණක වැඩසටහන් නිර්මාණය හා සංවර්ධනය කිරීම. එවැනි වැඩසටහන් නඩත්තු කිරීම සහ අවශ්‍ය විටෙක එම පරිගණක වැඩසටහන් යාවත්කාලීන කිරීම.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / ඉංජිනේරු / තොරතුරු තාක්ෂණය / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක්.
2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්ද.
4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු දහයක (10) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

(13) මානව සම්පත් සහ පරිපාලන නිලධාරී තනතුර (JM 1-1)

පුරප්පාඩු ගණන (02)

රැකියා විස්තරය:

ආයතනික කාර්යයන්ට අදාළ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම. කාර්ය මණ්ඩල සංවර්ධනය සහ සුභසාධනය සඳහා සහභාගී වීම. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සැපයුම් අවශ්‍යතා සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අපනයන සංවර්ධන මණ්ඩලයෙහි කුලිය/විදුලිය/ ජලය/දුරකථන බිල්පත් පියවීමට අදාළ කරුණු පිළිබඳව කටයුතු කිරීම. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල ආරක්ෂක සේවයට අදාළ කරුණු පිළිබඳව කටයුතු කිරීම. මානව සම්පත් අංශය තුළ නිසි ගෘහ පාලනයක් සහතික කිරීම. අපනයන සංවර්ධන මණ්ඩලයෙහි මානව සම්පත් ප්‍රතිපත්තිය සහ මානව සම්පත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත් කළමනාකරුට සහාය වීම. බඳවා ගැනීම් සහ උසස්වීම්, නිවාඩු, පැමිණීම සහ අතිකාල කටයුතු පිළිබඳව කටයුතු කිරීම. එක් එක් සේවකයාට අදාළව කිසියම් වෙනසක් සිදු වූ විට පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම. මානව සම්පත් පුහුණුව සහ සංවර්ධනයට අදාළ කරුණු, විනය පරීක්ෂණවලට අදාළ කරුණු පිළිබඳව කටයුතු කිරීම. ඉහළ කළමනාකාරිත්වය විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී.

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන් සඳහා:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය (මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ) / කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ) / වාණිජ්‍ය (B.Com) උපාධියක්.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2):

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

වයස් සීමාව (10), (11), (12) සහ (13) තනතුරු සඳහා:

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : JM 1-1 (10), (11), (12) සහ (13) තනතුරු සඳහා :

රු. 72,650/- 10 X 1,360 - 18 X 2,040 = රු. 122,970/- . 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයේ සඳහන් උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ.

2025 වර්ෂය සඳහා ගෙවන ලද මූලික වැටුප - රු. 58,615/=.

2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි - රු. 65,633/- (ඊට අමතරව ජීවන වියදම් දීමනාව 17,800/- සහ තනතුරට අදාළ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා)

තෝරාගැනීමේ ක්‍රමය (10), (11), (12) සහ (13) තනතුරු සඳහා :

පත්කිරීමේ අධිකාරිය (අපනයන සංවර්ධන මණ්ඩලය) විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ / හෝ ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත.

ඉහත තනතුරු සඳහා වන සියලුම පත්වීම් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට හිමිකම් ඇති අතර, පහත සඳහන් පරිදි දායකත්වයට යටත් වේ.

EPF - සේවකයා - 10%; මණ්ඩලය - 15% සහ ETF - මණ්ඩලය 3%

ඔබ සුදුසු යැයි සලකන්නේ නම්, **2025.11.13** දින හෝ ඊට පෙර අයදුම් කිරීමට ඔබට ආරාධනා කරනු ලැබේ.

අයදුම්පත් www.srilankabusiness.com වෙබ් අඩවියට පිවිසීමෙන් ("නිවේදන" කොටස යටතේ) ලබා ගත හැකි නියමිත පෝරමය මගින් ඉදිරිපත් කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ සහතිකවල පිටපත් අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරි වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර නාමය සඳහන් කළ යුතුය. නියමිත පෝරමයේ (අපනයන සංවර්ධන මණ්ඩලයේ අයදුම්පත) ඉදිරිපත් කර නොමැති සහ අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති හා අසම්පූර්ණ අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ අතිරේක පිටපතක් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පෙර සභාපති / ප්‍රධාන විධායක නිලධාරි වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
NDB-EDB කුලුන, 42, නවම් මාවත, කොළඹ 02.
දුරකථන : 011-2300700 ෆැක්ස්: 011-2300715
වෙබ් අඩවිය : www.srilankabusiness.com